# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1795/51 - 2013 පෙබරවාරි මස 01 වැනි සිකුරාදා - 2013.02.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 11/80.

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2013 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 ආහාර (රසකාරක ද්‍රව්‍ය සහ රස ප්‍රවර්ධක) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර එම නියෝග 2014 ජූලි 01 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

2. (1) යම් රසකාරක ද්‍රව්‍යයක් හෝ රස ප්‍රවර්ධකයක් එහි සම්භවය ඇති රටෙහි හෝ නිෂ්පාදිත රටෙහි අදාළ අධිකාරිය විසින් ආහාර සඳහා භාවිත කිරීම ආරක්ෂිත සහ යෝග්‍ය බවට සහතිකකර ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් ආහාර සඳහා භාවිත කිරීම පිණිස කිසිම රසකාරක ද්‍රව්‍යයක් හෝ රස ප්‍රවර්ධකයක් ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, බෙදා හැරීම, භාවිත කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

(2) මෙහි 9 වැනි නියෝගයෙහි අන්තර්ගත අවශ්‍යතාවයන්ට අනුව යම් අවසරලත් රසකාරක ද්‍රව්‍ය හෝ රස ප්‍රවර්ධක ලේබලයක් සහිත ඇසුරුමක බහා ඇත්නම් මිස (වෙනත් යම් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කරන ලද යම් අවසරලත් රසකාරක ද්‍රව්‍ය හෝ රස ප්‍රවර්ධක ඇතුලුව) යම් අවසරලත් රසකාරක ද්‍රව්‍යයක් හෝ රස ප්‍රවර්ධකයක්, ආහාරයක් සකස් කිරීම සඳහා අඩංගු ද්‍රව්‍යයක් ලෙස කිසිම තැනැත්තකු විසින් ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, බෙදා හැරීම, භාවිතා කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

3. කිසිදු තැනැත්තකු විසින් මෙම නියේගවල 1 වැනි උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති රසකාරක ද්‍රව්‍යයක් අඩංගුවන රසකාරක සැකසුමක්, කිසිදු ආහාර ද්‍රව්‍යයක් සඳහා භාවිත නොකළ යුතු ය.

1A - PG 001548 — 3310 (2013/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. මෙහි II වැනි උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති ද්‍රාවකයක් හැර වෙනත් යම් ද්‍රාවකයක අන්තර්ගත වන යම් රසකාරක ද්‍රව්‍යයක් කිසිම තැනැත්තකු විසින් ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, බෙදා හැරීම, භාවිත කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

5. ජලය හැර II වැනි උපලේඛණයේ සඳහන් රසකාරක ද්‍රව්‍ය සඳහා භාවිත කරනු ලැබිය හැකි අවසරලත් ද්‍රාවකයන් බ්‍රිතාන්‍ය හෝ එක්සත් ජනපද ඖෂධ සංග්‍රහ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

6. ආහාරවල රස ප්‍රවර්ධක වශයෙන් පහත සඳහන් ද්‍රව්‍ය භාවිතා කරනු ලැබිය හැකිය.

| | | |
|---|---|---|
| (අ) | මොනෝසෝඩියම් ග්ලුටමේට් | INS - 621 |
| (ආ) | ඩයිසෝඩියම් 5' - ග්වානිලේට් | INS - 627 |
| (ඇ) | ඩයිසෝඩියම් 5' - ඉනොසිනේට් | INS - 631 |

7. රස ප්‍රවර්ධක-

(i) යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) අනුගමනය කිරීම සහ භාවිත කරන ලද නිශ්චිත ද්‍රව්‍ය හෝ ද්‍රව්‍යන් පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් අඩංගු ලේබලයක් සහිතව ආහාර සඳහා එකතු කරනු ලැබිය හැකි ය ;

(ii) ළදරුවන් හෝ වයස අවුරුදු තුනට අඩු ළමුන් සඳහා භාවිත කරනු ලබන කිසිම ආහාර වර්ගයක් සඳහා එකතු නොකළ යුතු ය ; සහ

(iii) මෙහි III වැනි උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති ආහාර ද්‍රව්‍ය සඳහා භාවිත නොකළ යුතු ය.

8. (1) රසකාරක ද්‍රව්‍ය හෝ රස ප්‍රවර්ධක අඩංගු වන යම් ආහාර ද්‍රව්‍යයක් ලේබල් කිරීම, පසුව සංශෝධනය හෝ ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි 2005 ජනවාරි මස 19 වැනි දින අංක 1376/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝග 2005 විධිවිධානවලට අනුකූල විය යුතු ය.

(2) ආහාර ද්‍රව්‍ය ඇසුරුමක මුද්‍රණය කර හෝ අලවා ඇති ලේබලය මත-

(අ) අඩංගු ද්‍රව්‍යයක් වශයෙන් ස්වාභාවික රසකාරක ද්‍රව්‍යයක් අන්තර්ගත නම් "ස්වභාවික (x) රසකාරකය" යන වචන අන්තර්ගත විය යුතු ය. මෙහි (x) යනු රසකාරක ද්‍රව්‍යය පිළිබඳ විස්තරය විය යුතු ය. (උදා : ස්වාභාවික අඹ රසකාරකය, ස්වාභාවික කුකුල්මස් රසකාරකය) ;

(ආ) අඩංගු ද්‍රව්‍යයක් වශයෙන් යම් ස්වාභාවික රසයට සමාන රසකාරක ද්‍රව්‍යයන් අන්තර්ගත නම් "ස්වභාවික රසයට සමාන (x) රසකාරකය" යන වචන අන්තර්ගත විය යුතු ය. මෙහි (x) යනු රසකාරක ද්‍රව්‍යය පිළිබඳ විස්තරය විය යුතු ය ;

(ඇ) අඩංගු ද්‍රව්‍යයක් වශයෙන් කෘත්‍රිම රසකාරක ද්‍රව්‍යයක් අන්තර්ගත නම් "කෘත්‍රිම (x) රසකාරකය" යන වචන අන්තර්ගත විය යුතු ය. මෙහි (x) යනු රසකාරක ද්‍රව්‍යය පිළිබඳ විස්තරය විය යුතු ය ; සහ

(ඈ) අඩංගු ද්‍රව්‍යයක් වශයෙන් යම් රස ප්‍රවර්ධකයක් හෝ ප්‍රවර්ධක අන්තර්ගත නම් අවස්ථාවෝචිත පරිදි, එහි පොදු නම හෝ නම් ද සමග "භාවිත රස ප්‍රවර්ධකය" හෝ "භාවිත රස ප්‍රවර්ධක" යන වචන සහ ඒවාට වෙන්කර ඇති අයි. එන්. එස්. (INS) අංක ද අන්තර්ගත විය යුතු ය.

(3) ආහාර ද්‍රව්‍ය ඇසුරුමක් මත මුද්‍රණය කර හෝ අලවා ඇති ලේබලයෙහි යම් ආහාර වර්ගයක ස්වාභාවික රසයට සමාන රසකාරක ඇති විට "ස්වභාවික රසකාරක" යනුවෙන් විස්තර නොකළ යුතු ය.

(4) ආහාර ද්‍රව්‍යයක යම් රස ප්‍රවර්ධකයක් හෝ ප්‍රවර්ධක අන්තර්ගත වන අවස්ථාවක දී, ආහාර ද්‍රව්‍ය ඇසුරුමක් මත මුද්‍රණය කර හෝ අලවා ඇති ලේබලයෙහි වෙනත් යම් රස ප්‍රවර්ධකයක් නොමැති බවට කිසිම ප්‍රකාශයක් නොකළ යුතු ය.

9. (1) රසකාරක ද්‍රව්‍යයක් හෝ රස ප්‍රවර්ධකයක් අන්තර්ගත යම් ඇසුරුමක ලේබලය පසුව සංශෝධනය හෝ ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි 2005 ජනවාරි මස 19 වැනි දින අංක 1376/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝග 2005 විධිවිධානවලට අනුකූල විය යුතු ය.

(2) රසකාරක ද්‍රව්‍ය අඩංගු බඳුනක මුද්‍රණය කර ඇති හෝ එයට අලවා ඇති ලේබලයේ-

(අ) ස්වභාවික රසකාරක ද්‍රව්‍ය සම්බන්ධයෙන් "ස්වභාවික (මෙහි රසකාරකය පිළිබඳ විස්තරය සඳහන් කරන්න) රසකාරකය" යන වචන ඇතුළත් විය යුතු ය ;

(ආ) ස්වාභාවික රසයට සමාන රසකාරක ද්‍රව්‍ය සම්බන්ධයෙන් "ස්වාභාවික රසයට සමාන (මෙහි රසකාරකය පිලිබඳ විස්තරය සඳහන් කරන්න) රසකාරකය" යන වචන ඇතුළත් විය යුතු ය ;

(ඇ) කෘත්‍රිම රසකාරක ද්‍රව්‍ය සම්බන්ධයෙන් "කෘත්‍රිම (මෙහි රසකාරකය පිළිබඳ විස්තරය සඳහන් කරන්න) රසකාරකය" යන වචන සඳහන් විය යුතු ය ;

(ඈ) රසකාරක ද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් ස්වභාවික රසයට සමාන රසකාරකයක් "ස්වභාවික රසකාරක" වශයෙන් විස්තර නොකළ යුතු ය.

(ඉ) මෙම ඡේදයේ (අ), (ආ) සහ (ඇ) අනු-ඡේදවල සඳහන් යම් රසකාරකයක අන්තර්ගත වෙනත් ද්‍රව්‍ය ඇත්නම් ඒවායෙහි පොදු නම සහ අයි. එන්. එස්. (INS) අංක තිබේනම් අවස්ථාවෝචිත පරිදි සඳහන් කළ යුතු ය ;

(ඊ) "ආහාර සඳහා" යනුවෙන් හෝ "ආහාර සඳහා භාවිත කිරීම සීමාකර ඇත" යනුවෙන් හෝ ආහාර සඳහා භාවිත කිරීමට අපේක්ෂිත ආකාරය වඩාත් නිශ්චිතව සඳහන් කරනු ලබන ප්‍රකාශයක් අවස්ථාවෝචිත පරිදි ඇතුළත් විය යුතු ය.

10. මෙම නියෝගවල -

"කෘත්‍රිම රසකාරකය" යන්නෙන් ස්වභාවික සුවඳ විහිදුවන අමුද්‍රව්‍යකින් හෝ ස්වභාවික රස සාන්ද්‍රණයකින් හඳුනා නොගත් රස කාරකයක් වන්නා වූ ද, පහත එක් ආකාරයකින් හෝ ඊට වැඩි ගණනක් මගින් ආහාර සමග භාවිත කිරීම සඳහා ආරක්ෂිත බව පිළිගෙන ඇත්තා වූ ද, මෙම නියෝග යටතේ තහනම්කර නොමැති වූ යම් රසකාරකයක් අදහස් වන අතර ස්වභාවික රසකාරක ද්‍රව්‍ය හෝ ස්වභාවික රසයට සමාන රසකාරක ද්‍රව්‍ය අඩංගු විය හැකි ය :-

(අ) කෝඩ් ඔෆ් ෆෙඩරල් රෙජිස්ටරයෙහි ලැයිස්තුගත කර ඇති එක්සත් ජනපද ආහාර සහ ඖෂධ පරිපාලනය (FDA) මගින් රසකාරක ද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීමට අවසර දී ඇති ද්‍රව්‍ය ;

(ආ) රසකාරක සහ නිස්සාරණ නිෂ්පාදකයින්ගේ සංවිධානයේ (FEMA) ස්වාධීන විශේෂඥයින් විසින් නිශ්චය කරන ලද සාමාන්‍යයෙන් ආරක්ෂිත බවට (GRAS) පිළිගෙන ඇති ද්‍රව්‍ය ;

(ඇ) ආහාර ආකලන ද්‍රව්‍ය සම්බන්ධ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)/ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ඒකාබද්ධ විශේෂඥ කමිටුව (JEFCA) විසින් ඇගයීමට ලක්කල කෝඩෙක්ස් (CODEX) ආයතනය පිළිගත් නවතම රසකාරක ලැයිස්තුවට අනුව රසකාරක ද්‍රව්‍යයක් ලෙස ආහාර සඳහා භාවිත කිරිමේදී ආහාර ආරක්ෂාව පිළිබඳ ගැටළුවක් මතු නොකරන ද්‍රව්‍ය.

"තුනපහ කුඩු හෝ ව්‍යංජන කුඩු" යන්නෙන් වියලි, පිරිසිදු, කළු ගම්මිරිස්, කුරුඳු, කරාබු, කොත්තමල්ලි, සූදුරු, උළුහාල්, සුදුළූණු, ඉගුරු, අබ, කහ, සාදික්කා, කරපිංචා යනාදී කුළුබඩු දෙකක් හෝ කිහිපයක් ඇඹරීමෙන් ලබාගන්නා කුඩු අදහස් වේ.

"සූපවේදය සඳහා යොදාගනු ලබන ශාක" යන්නෙන් ආහාර රසකාරක ද්‍රව්‍යයක් ලෙස යොදාගනු ලබන පැළෑටිවල අමු හෝ වියලි කොළ අදහස් වේ
උදා : කොත්තමල්ලි කොළ, කරපිංචා, රම්පේ.

"ළදරුවන් හෝ වයස අවුරුදු තුනට අඩු ළමුන් සඳහා ආහාර" යන්නෙන්, ළදරුවන් හෝ වයස අවුරුදු තුනට අඩු ළමයින් සඳහා විශේෂයෙන් පිළියෙල කරන ලද, නිෂ්පාදනය කරන ලද හෝ අලෙවි කරන ආහාර අදහස් වේ.

"රස ප්‍රවර්ධක" යන්නෙන් ආහාර සමඟ එකතුකළ විට එම ආහාරයේ රසය ප්‍රවර්ධනය වන හෝ වැඩිදියුණුවන යම් ද්‍රව්‍යක් අදහස් වේ.

"ස්වභාවික සුවඳ විහිදුවන අමුද්‍රව්‍ය" යන්නෙන් ස්වාභාවික ආකාරයෙන් වූ හෝ රත්කිරීම හැර අනෙකුත් භෞතික ක්‍රමවලින් පිරිසැකසුම් කිරීමෙන් ලබාගන්නා රසකාරක ගුණ ඇති යම් ශාක හෝ සත්ව ප්‍රභවයන්ගෙන් යුත් ද්‍රව්‍ය අදහස් වේ.

"ස්වාභාවික රසකාරක සාන්ද්‍රන" යන්නෙන් අමු තත්ත්වයේ පවතින හෝ වියලීම, බැදීම සහ පැසවීම ද ඇතුලුව පාරම්පරික ආහාර සකස් කිරීමේ ක්‍රියාවලි මගින් පිරිසැකසුම් කරනු ලැබූ ශාක හෝ සත්ව ප්‍රභවයක් ඇති ද්‍රව්‍යවල සිදුවන භෞතික, ක්‍ෂුද්‍රජීව විද්‍යාත්මක හෝ එන්සයිම ක්‍රියාවලියක් මගින් ලබාගත් සාන්ද්‍රිත සැකසුමක් අදහස් වේ.

"ස්වභාවික රසකාරක ද්‍රව්‍ය" යන්නෙන් අමු තත්ත්වයේ පවතින හෝ වියලීම, බැදීම සහ පැසවීම ද ඇතුලුව පාරම්පරික ආහාර සකස් කිරීමේ ක්‍රියාවලි මගින් පිරිසැකසුම් කරනු ලැබූ ශාක හෝ සත්ව ප්‍රභවයක් ඇති ද්‍රව්‍යවල සිදුවන ක්‍ෂුද්‍රජීවවිද්‍යාත්මක, භෞතික, ක්‍ෂුද්‍රජීව විද්‍යාත්මක හෝ එන්සයිම ක්‍රියාවලියක් මගින් ලබාගත් තනි රසායනික ඒකකයක් අදහස් වන අතර එය මෙම නියෝග යටතේ තහනම් කරනු ලැබූවක් නොවිය යුතු අතර පහත එක් ආකාරයකින් හෝ ඊට වැඩි ගණනක් මගින් පෙන්නුම්කර ඇති ආහාර වලදී යොදා ගැනීමට ආරක්ෂා සහිත ලෙස පිළිගනු ලැබූවක් විය යුතු ය. ස්වභාවික රසකාරක සඳහා "ස්වභාවික රසකාරක සාන්ද්‍රණයක් ", "ස්වභාවික රසකාරක ද්‍රව්‍ය" සහ " ස්වභාවික සුවඳ විහිදුවන අමුද්‍රව්‍ය" ඇතුළත් විය හැකිය. නමුත් ස්වාභාවික රසකාරක සඳහා යම් ස්වභාවික රසයට සමාන රසකාරක ද්‍රව්‍යයක් හෝ කෘත්‍රිම රසකාරක ද්‍රව්‍යයක් ඇතුළත් නොවිය යුතු ය :-

(අ) කෝඩ් ඔෆ් ෆෙඩරල් රෙජිස්ටරයෙහි ලැයිස්තුගතකර ඇති එක්සත් ජනපද ආහාර සහ ඖෂධ පරිපාලනය (FDA) මගින් රසකාරක ද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරිමට අවසර දී ඇති ද්‍රව්‍ය ;

(ආ) රසකාරක සහ නිස්සාරණ නිෂ්පාදකයින්ගේ සංවිධානයේ (FEMA) ස්වාධීන විශේෂඥයින් විසින් නිශ්චය කරන ලද සාමාන්‍යයෙන් ආරක්ෂිත බවට (GRAS) පිළිගෙන ඇති ද්‍රව්‍ය ;

(ඇ) ආහාර ආකලන ද්‍රව්‍ය සම්බන්ධ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ඒකාබද්ධ විශේෂඥ කමිටුව (JEFCA) විසින් ඇගයීමට ලක්කල කෝඩෙක්ස් (CODEX) ආයතනය පිළිගත් නවතම රසකාරක ලැයිස්තුවට අනුව රසකාරක ද්‍රව්‍යයක් ලෙස ආහාර සඳහා භාවිත කිරීමේදී ආහාර ආරක්ෂාව පිළිබඳ ගැටළුවක් මතු නොකරන ද්‍රව්‍ය.

"ස්වාභාවික රසයට සමාන රසකාරක ද්‍රව්‍ය" යන්නෙන් සුවඳ විහිදුවන ද්‍රව්‍යවලින් රසායනිකව වෙන් කරන ලද හෝ කෘත්‍රිමව ලබාගත් සහ මිනිස් පරිභෝජනය පිණිස වූ ස්වභාවික නිෂ්පාදනවල අන්තර්ගත ද්‍රව්‍යවලට රසායනික ලෙස සමාන යම් රසකාරක ද්‍රව්‍ය අදහස් වන අතර එය මෙම නියෝග යටතේ තහනම් කරනු ලැබූවක් නොවිය යුතු හා පහත එක් ආකාරයකින් හෝ ඊට වැඩි ගණනක් මගින් පෙන්නුම්කර ඇති ආහාර වලදී යොදා ගැනීමට ආරක්ෂා සහිත ලෙස පිළිගනු ලැබූවක් විය යුතු අතර ස්වභාවික රසයට සමාන රසකාරක ද්‍රව්‍ය සඳහා ස්වභාවික රසකාරක ද්‍රව්‍ය අන්තර්ගත විය හැකි නමුත් කෘත්‍රිම රසකාරක ද්‍රව්‍ය ඊට ඇතුළත් නොවිය යුතු ය :-

(අ) කෝඩ් ඔෆ් ෆෙඩරල් රෙජිස්ටරයෙහි ලැයිස්තුගතර ඇති එක්සත් ජනපද ආහාර සහ ඖෂධ පරිපාලනය (FDA) මගින් රසකාරක ද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීමට අවසර දී ඇති ද්‍රව්‍ය ;

(ආ) රසකාරක සහ නිස්සාරණ නිෂ්පාදකයින්ගේ සංවිධානයේ (FEMA) ස්වාධීන විශේෂඥයින් විසින් නිශ්චය කරන ලද සාමාන්‍යයෙන් ආරක්ෂිත බවට (GRAS) පිළිගෙන ඇති ද්‍රව්‍ය ;

(ඇ) ආහාර ආකලන ද්‍රව්‍ය සම්බන්ධ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)/ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ඒකාබද්ධ විශේෂඥ කමිටුව (JEFCA) විසින් ඇගයීමට ලක්කල කෝඩෙක්ස් (CODEX) ආයතනය පිළිගත් නවතම රසකාරක ලැයිස්තුවට අනුව රසකාරක ද්‍රව්‍යයක් ලෙස ආහාර සඳහා භාවිත කිරීමේදී ආහාර ආරක්ෂාව පිළිබඳ ගැටළුවක් මතු නොකරන ද්‍රව්‍ය.

## I වැනි උපලේඛනය

*3 වැනි නියෝගය*

*ආහාර සඳහා භාවිත කිරීම තහනම්වන රසකාරක ද්‍රව්‍ය*

1. ඇලොයින් (Aloin)
2. බර්බරින් (Berberine)
3. බීටා - ඇසරෝන් සහ සිනමයිල් ඇන්ත්‍රක්සිලේට් (Beta - Azarone and cinnamyl anthracillate)
4. කේඩ් ඔයිල් (Cade oil)
5. කැලමස් ඔයිල් (Calamus oil)

6. කොකේන් (Cocaine)
7. කුමරින් (Coumarin)
8. ඩයිඑතිලීන් ග්ලයිකෝල් (Diethylene glycol)
9. ඩයිඑතිලීන් ගල්යිකෝල් මොනො ඊතයිල් ඊතර් (Diethylene glycol mono ethyl ether)
10. එස්ට්‍රගෝල් (Estragole)
11. ඉයුජිනයිල් මීතයිල් ඊතර් (Eugenyl methyl ether)
12. හයිපරිසින් (Hypericine)
13. නයිට්‍රොබෙන්සීන් (Nitrobenzene)
14. පයිරොලීජිනස් ඇසිඩ් (Pyroligenous acid)
15. සැෆ්රෝල් සහ අයිසො සැෆ්රෝල් (Saffrole and isosaffrole)
16. සැන්ටොනින් (Santonin)
17. සසාප්‍රස් ඔයිල් (Sasafras oil)
18. තුජෝන්, අයිසෝතුජෝන් (ඇල්ෆා (α ) සහ බීටා (ß ) තුජෝන්) (Thujone, Isothujone (α and ß thujone)
19. ටොන්කා බීන් (ඩිප්ට්ටරයිල් ඇඩොරට්) (Tonka bean) (Dipteryl adorat)
20. සෞඛ්‍යයට අහිතකර හෝ අහිතකර වියහැකි වෙනත් යම් රසකාරක ද්‍රව්‍යයක් (Any other flavouring substance that is injurious or likely to be injurious to health)

## II වැනි උපලේඛනය

*4 වැනි සහ 5 වැනි නියෝග*

***අවසරලත් ද්‍රාවකයන්***

*පහත සඳහන් ද්‍රාවකයන් රසකාරක ද්‍රව්‍ය සමග භාවිත කිරීම සඳහා අවසර ලබාදී ඇත.*

1. ඩයිඇසටීන් (ග්ලසරීන් ඩයිඇසිටේට්, ග්ලිසරයිල් ඩයි ඇසිටේට්, ග්ලිසරොල් ඩයි ඇසිටේට්)
2. ඩයිඊතයිල් ඊතර්
3. ඊතයිල් ඇසිටේට්
4. ඊතයිල් ඇල්කොහොල්
5. ග්ලිසරොල්
6. අයිසොප්‍රොපයිල් ඇල්කොහොල්
7. ප්‍රොපිලීන් ග්ලයිකෝල්
8. ට්‍රයිඇසටින් (ග්ලිසරීන් ට්‍රයිඇසිටේට්, ග්ලිසරයිල් ට්‍රයි ඇසිටේට්, ග්ලිසරෝල් ට්‍රයි ඇසිටේට්)
9. ජලය

## III වැනි උපලේඛනය

*7 (iii) වැනි නියෝගය*

*රසකාරක ප්‍රවර්ධක යෙදීම තහනම් කරන ලද ආහාර ද්‍රව්‍ය*

1. කිරි සහ කිරි නිෂ්පාදන
2. අයිස්ක්‍රීම් සහ අධිශීතකරණ ලද අතුරු පස
3. මේද සහ තෙල්
4. මාගරින් සහ මේද තැවරුම (ප්‍රැට් ස්ප්‍රේඩ්)
5. නැවුම්, මතුපිට සකස්කළ, පොතු හරින ලද හෝ කපන ලද පළතුරු සහ එළවළු

6. හතු සහ හතු නිෂ්පාදන
7. පළතුරු වයින්
8. පළතුරු කුඩු, එළවළු කුඩු, ක්ෂණික පළතුරු සහ එළවළු වට්නි මිශ්‍රණය (වියලි) හැර සියලු පළතුරු සහ එළවළු නිෂ්පාදන
9. විනාකිරි
10. ආහාර ධාන්‍ය, මාෂ තෙල් සහිත ඇට සහ අඹරනලද පිටිකළ ධාන්‍ය
11. සහල් ඇතුළුව සම්පූර්ණ, කැඩුන හෝ පැතලි ලෙස සකස්කරන ලද ධාන්‍ය වර්ග
12. කෑමට සුදුසු ධාන්‍ය පිටි සහ පිෂ්ඨය
13. සව්
14. පැස්ටා සහ නූඩ්ල්ස් (වියලි නිෂ්පාදන පමණි)
15. මෝල්ට් අඩංගු ආහාර සහ කිරි අඩංගු ආහාර
16. බේකරි නිෂ්පාදන
17. සම්පූර්ණ කොටස් හෝ කැබලි කරන ලද හෝ කුඩා කොටස් කරන ලද අලුත් මස්, කුකුල් මස් සහ දඩමස්
18. අලුත් මාලු සහ මොලස්කාවන්, ක්‍රස්ටේසියාවන් සහ සෙලවර්මීන්
19. සුදු සීනි, දුඹුරු සීනි සහ සුක්‍රෝස්, ෆරක්ටෝස්, ග්ලූකෝස් (ඩෙක්ස්ට්‍රෝස්) සයිලෝස්, සීනි ද්‍රාවන සහ සිරප් මෙන්ම (අර්ධ වශයෙන්) පරිවර්තිත සීනි, හකුරු, පැණි, සීනි ඇතිරුම්, වෙනත් සීනි වර්ග සහ සිරප් වර්ග, මී පැණි
20. සීනි රස කැවිලි
21. අයිස් - කැන්ඩි
22. විශේෂිත ව්‍යාංජන මිශ්‍රන සහ සැෂේ (sachet) පැකැට්ටුවල අඩංගු රසකාරක හැර සූපවේදය සඳහා යොදාගනු ලබන ශාක, කුලුබඩු, තුනපහ කුඩු සහ ව්‍යාංජන කුඩු
23. කලු තේ, හරිත තේ, කෝපි, ශාකසාර සහ ධාන්‍යමය බීම වර්ග
24. බේකින් පවුඩර්
25. කොකෝවා බටර් සහ කොකෝවා නිෂ්පාදන

02-585